අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society

සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමූපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය දිවයිනේ අධ්‍යාපන සේවයේ නියුතුවූවන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර ඇති සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳව ක්‍රියාකරනු ලබන සමූපකාර සමිතියකි.

සමිතියේ ප්‍රධාන කාර්යාලයේ හා ශාඛා කාර්යාලවල පවතින මතු සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම සඳහා **සමිතියේ සේවයේ නියුතු ස්ථිර සේවකයින්ගෙන් සහ බාහිර අයදුම්කරුවන්ගෙන්** ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් පහත සඳහන් පොදු කොන්දේසිවලට අදාළව සකසන ලද අයදුම්පත්‍ර 2026-11-26 දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් හෝ ගෙනවිත් ප්‍රධාන සභාපති වෙත ලැබෙන සේ භාරදිය යුතුය. තව ද මෙම දැන්වීමේ දැක්වෙන QR කේතය භාවිතා කර මාර්ගගත ක්‍රමයටද අයදුම් කල යුතුය. (QR කේතය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට පමණක් අයදුම් කිරීම ප්‍රමාණවත් නොවේ)

(කිළිනොච්චිය, මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල හැර දිවයිනේ අනෙකුත් සියළු දිස්ත්‍රික්කවල ප්‍රධාන නගරයන්හි සමිතියේ ශාඛා කාර්යාල පවතී.)

මේ සඳහා කුසලතා පූර්ණ, උද්‍යෝගිමත් හා කැපවීමෙන් යුතුව වැඩකිරීමේ හැකියාව ඇති සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

## නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී (විධායක සේවා අංශය E.2 - III ශ්‍රේණිය)

1. පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ යන විෂයන් 01 ක් හෝ ආයතනයේ අරමුණු හා පරමාර්ථයන්ට අනුකූල වන විෂයක් ඇතුලත් වන පරිදි පශ්චාත් උපාධියක් සමඟ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්ද

**හෝ**

2. පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ යන විෂයන් 01 ක් හෝ ආයතනයේ අරමුණු හා පරමාර්ථයන්ට අනුකූල වන විෂයක් ඇතුලත් වන පරිදි පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 04 ක පළපුරුද්ද

**හෝ**

3. පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ යන විෂයන් 01 ක් හෝ ආයතනයේ අරමුණු හා පරමාර්ථයන්ට අනුකූල වන විෂයක් ඇතුලත් වන පරිදි උපාධිය සමඟ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය** :- මාසික 57,400 - 1,200X 10

**පුරප්පාඩු සංඛ්‍යාව** :- 01

## ප්‍රධාන මූල්‍ය කළමණාකරු (විධායක සේවා අංශය E.2 - III ශ්‍රේණිය)

**1.** පිළිගත් විශ්ව විද්‍යාලයක ගණකාධිකරණ, ව්‍යාපාර කළමනාකරණ, වාණිජ පශ්චාත් උපාධියක් සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

**2.** පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ, ව්‍යාපාර කළමනාකරණ, වාණිජ උපාධියක් සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 04 ක පළපුරුද්ද

**හෝ**

**3.** කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක සිව් වසරක ගණකාධිකරණ, වාණිජ ඩිප්ලෝමාව සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

**4.** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත් වීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසන් අදියර සමත්වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 05 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය** :- මාසික 57,400 - 1,200X 10

**පුරප්පාඩු සංඛ්‍යාව** :- 01

## ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී (විධායක සේවා අංශය E.2 - III ශ්‍රේණිය)

**1.** පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

**2.** පරිගණක විද්‍යාව පිළිබඳ උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 04 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය** ඃ මාසික 57,400 - 1,200X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 01

## ප්‍රධාන අභ්‍යන්තර විගණක (විධායක සේවා අංශය E.2 - III ශ්‍රේණිය)

**1.** පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ, ව්‍යාපාර කළමනාකරණ, වාණිජ පශ්චාත් උපාධියක් සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

**2.** පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ, ව්‍යාපාර කළමනාකරණ, වාණිජ උපාධියක් සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 04 ක පළපුරුද්ද

**හෝ**

**3.** ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක වසර 04 ක ගණකාධිකරණ/ වාණිජ ඩිප්ලෝමාව සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

**4.** ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත් වීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසන් අදියර සමත් වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්/ විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 05 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය ඃ මාසික 57,400 - 1,200X 10**

පුරප්පාඩු සංඛ්‍යාව - 01

## කළමණාකරු (මාධ්‍ය හා ප්‍රවර්ධන) (විධායක සේවා අංශය E.3.1 - III ශ්‍රේණිය)

**1.** පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජන සන්නිවේදනය/ ජනමාධ්‍ය/ සන්නිවේදන අධ්‍යයනය උපාධිය සමඟ විධායක මට්ටමේ වසර 03 ක පළපුරුද්ද

**හෝ**

**2.** අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයකින් ජන මාධ්‍ය/ ජන සන්නිවේදනය/ ජනමාධ්‍ය සහ ප්‍රචාරණය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 05 ක පළපුරුද්ද

**හෝ**

**3.** පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජන සන්නවේදනය/ ජනමාධ්‍ය/ සන්නිවේදන අධ්‍යයනය උපාධිය සමඟ බඳවා ගැනීම සිදුකරනු ලබන සමුපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික නිලධාරී තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

**4.** අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයකින් ජනමාධ්‍ය පිළිබඳ සන්නිවේදන අධ්‍යයනය/ ජන සන්නිවේදනය/ ජනමාධ්‍ය හා ප්‍රචාරණය යන වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ බඳවා ගැනීම සිදුකරනු ලබන සමුපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික නිලධාරී තනතුරක වසර 07 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය :-** මාසික 50,600 - 900 X 10

**පුරප්පාඩු සංඛ්‍යාව** :- 01

## නීති නිලධාරී (විධායක සේවා අංශය E.3.2 - III ශ්‍රේණිය)

**1.** වසර 03 ක පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවිරුම් දුන් නීතීඥවරයෙකු වීම

**වැටුප් පරිමාණය ඃ** මාසික 48,400 - 720 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 01

## පරිපාලන නිලධාරී (විධායක සේවා අංශය E.3.2 - III ශ්‍රේණිය)

**1.** පිළිගත් විශ්වවිද්‍යාලයක මානව සම්පත් කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳ උපාධිය සමඟ මානව සම්පත් කළමනාකරණය හෝ ආයතන පරිපාලනය පිළිබඳ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්ද

**හෝ**

**2.** අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ පිළිගත් ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ වසරකට නොඅඩු මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ මානව සම්පත් කළමනාකරණය හෝ ආයතන පරිපාලනය පිළිබඳ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

**3.** ඉහත 1,2 හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක වසර 10 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

**හෝ**

**4.** ඉහත 1,2 හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මෙහෙයුම් සේවා කාණ්ඩයේ කළමනාකරණ සේවා නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී (ගිණුම්)/ විගණන සහකාර තනතුරක වසර 15 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

**වැටුප් පරිමාණය** ඃ මාසික 48,400 - 720 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 04

## සහකාර ගණකාධිකාරී (විධායක සේවා අංශය E.3.2 - III ශ්‍රේණිය)

**1.** පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජ/ මූල්‍ය කළමනාකරණය/ ගණකාධිකරණය යන ක්ෂේත්‍රයේ උපාධිය සමඟ ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 02ක පළපුරුද්ද

**හෝ**

**2.** ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ වසර 04 ක ඩිප්ලෝමා පාඨමාලාව සමඟ ගිණුම්කරණ / වාණිජ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 02 ක පළපුරුද්ද

**හෝ**

**3.** වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත් වීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ දෙවන අදියර සමත්වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද

**හෝ**

**4.** ගණකාධිකරණ ශිල්පී ආයතනයේ(AAT)තුන්වන අදියර සමත්වීම සමඟ පිළිගත් ආයතනයක ගිණුම්කරණ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 05 ක පළපුරුද්ද

**හෝ**

**5.** ඉහත 1,2,3හි සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලින් එකක් සමඟ බඳවා ගනු ලබන සමූපකාර සමිතියේ/ සංගමයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක වසර 07 ක පළපුරුද්ද සහ වැටුප් වර්ධක උපයාගෙන තිබීම

**වැටුප් පරිමාණය** ඃ මාසික 48,400 - 720 X 10

පුරප්පාඩු සංඛ්‍යාව - 2

**<u>පොදු කොන්දේසි</u>**

- අයදුම්කරුවන් වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. නමුත් දැනට සමුපකාර සේවයේ යෙදී සිටින අයෙකුට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
- ඉහත සඳහන් තනතුරට අදාළ මාසික වැටුපට අමතරව රු.17,800/-ක ජීවන වියදම් දීමනාවද, අනුමත රු.11,000/-දීමනාවද හිමි වනු ඇත.
- මෙම තනතුර ස්ථිරය. නමුත් විශ්‍රාම වැටුප් රහිතය. පත්වීම්ලාභියෙකු සඳහා සේවක අර්ථසාදක අරමුදල වෙනුවෙන් 10%ක් ගෙවිය යුතු අතර, ආයතනයෙන් 15% ක් බැර කෙරෙනු ඇත.
- අයදුම්කරුවන් ජීව දත්ත සහ සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ඇතුළත්ව තමා විසින්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කරගත් ජීවදත්ත පත්‍රිකාවක් සමඟ මෙහි සඳහන් අයදුම්පත්‍ර ආකෘතිය අනුව සකස් කර ගත් අයදුම්පත්‍රයක්ද සම්පූර්ණ කර ඉල්ලුම් කළ යුතුය.